ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනපති උපාධි වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2007

අධ්‍යාපනයේ පර්යේෂණ ක්‍රම - **ESP** 2313

කාලය පැය තුනයි.

---

දිනය - 2007.07.14 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න. එක් පර්යේෂණ ගැටළුවක් නිදසුන් වශයෙන් යොදා ගත හැකි වනුයේ එක් ප්‍රශ්නයක් සඳහා පමණක් බව සලකන්න.

01. පහත දැක්වෙන්නේ අධ්‍යාපන පර්යේෂණවලට සම්බන්ධ තේමා හතරකි. එක් තේමාවක් තෝරාගෙන 1- vii දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) පාසල් පාදක කළමනාකරණය හා විදුහල්පති භූමිකාව
(ආ) සියළුම පොදු විභාගවල ගණිතය විෂයයෙන් ඉහළ අසමාර්ථතා අනුපාත.
(ඇ) විෂය සමගාමී ක්‍රියාකාරකම් හා පාසල්වල ගැටළු
(ඈ) සෑම ළමයකුටම ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය

**(i)** ඉහත දක්වා ඇති එක් තේමාවකට අදාලව සුවිශේෂී පර්යේෂණ ගැටළුවක් හඳුනාගෙන සපයා ඇති ඉඩ ප්‍රමාණයේ ලියා දක්වන්න.

තේමාව - ------------------------------------------------

ගැටළුව - ------------------------------------------------

------------------------------------------------

(ලකුණු 06 යි)

**(ii)** සඳහන් කරන ලද පර්යේෂණ ගැටළුවට අදාලව සුවිශේෂී පර්යේෂණ අරමුණු/ප්‍රශ්න/උපකල්පිත තුනක් සකස් කරන්න. (3 x 3 = ලකුණු 9 යි.)

1. ------------------------------------------------

------------------------------------------------

2. ------------------------------------------------

------------------------------------------------

3. ------------------------------------------------

------------------------------------------------

**(iii)** ඔබගේ පර්යේෂණ ගැටළුව අධ්‍යයනය සඳහා සුදුසු පර්යේෂණ පිරිසැලසුමක් තෝරාගෙන ඔබේ තේරීම සාධාරණීකරණය කරන්න.

(2 x 2 = ලකුණු 4 යි.)

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

සුදුසු නියැදි සැලැස්ම ඔබගේ සාධාරණීකරණය සමග පැහැදිලි කරන්න.

(2 x 2 = ලකුණු 4 යි.)

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

**(iv)** ඔබ යොදා ගැනීමට අදහස් කරන දත්ත රැස් කිරීමේ ක්‍රම ශිල්ප හා දත්ත විශ්ලේෂණ ක්‍රම විධි දක්වන්න.

(3 x 2 = ලකුණු 6 යි.)

| අරමුණු/උපකල්පිත පර්යේෂණ ප්‍රශ්න | දත්ත රැස් කිරීමේ ක්‍රම | දත්ත විශ්ලේෂණ ක්‍රම විධි |
|---|---|---|
| 1 | ------------------------<br>------------------------ | ------------------------<br>------------------------ |
| 2 | ------------------------<br>------------------------ | ------------------------<br>------------------------ |
| 3<br>(**ii** කොටසට අනුව) | ------------------------<br>------------------------ | ------------------------<br>------------------------ |

**(v)** අධ්‍යයනයේ වැදගත්කම - (ලකුණු 4 යි)

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

vi. අපේක්ෂිත ප්‍රතිඵල (අවම වශයෙන් තුනක්) (ලකුණු 3 යි)

(I) ------------------------------------------------------------

(II) ------------------------------------------------------------

(III) ------------------------------------------------------------

vii. අධ්‍යයනයේ සීමා (අවම වශයෙන් දෙකක්) (ලකුණු 4 යි)

1. ------------------------------------------------------------

------------------------------------------------------------

2. ------------------------------------------------------------

------------------------------------------------------------

02. පහත සඳහන් ඕනෑම තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න. (ලකුණු 20)

i. පර්යේෂකයකුට දත්ත ත්‍රිකෝණකරණයේ ඇති ප්‍රයෝජන
ii. දත්ත රැස් කිරීමේ ක්‍රමයක් ලෙස නාභිගත සමූහ සාකච්ඡා
iii. සන්ධාර විශ්ලේෂණය - විවිධ ක්‍රම ශිල්ප
iv. අධ්‍යාපනය සඳහා ඓතිහාසික පර්යේෂණ ක්‍රියාත්මක කිරීම
v. සහභාගිත්ව නිරීක්ෂණය - පර්යේෂකයන් මුහුණ දෙන ගැටළු.

03. i. "දත්ත රැස් කිරීමේ උපකරණයක් ලෙස ප්‍රශ්නාවලි ඕනෑම පර්යේෂණ ගැටළුවක් සමග පහසුවෙන් ගැලපෙනු ඇත."
මෙම වගන්තිය පර්යේෂණයක දත්ත රැස් කිරීමේ උපකරණයක් තෝරා ගැනීම සඳහා යොදා ගන්නා නිර්ණායකවලට අදාලව විවේචනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 10)

ii. නිරීක්ෂණ වර්ග තුනක් නම් කර සුදුසු නිදසුන් භාවිත කරමින් ඒවායේ සමානකම් හා වෙනස්කම් සසඳන්න. (ලකුණු 10)

04. i. කාර්ය මූලික පර්යේෂණ පිරිසැලසුමෙහි ප්‍රධාන ලක්ෂණ 4 ක් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

ii. කාර්ය මූලික පර්යේෂණ පිරිසැලසුම භාවිතයෙන් අධ්‍යයනය කළ හැකි පර්යේෂණ ගැටළුවක් නම් කර ඉහත දැක් වූ ලක්ෂණ ඇතුළත් වන පරිදි විස්තරාත්මක පර්යේෂණ සැලැස්මක් ඉදිරිපත් කරන්න. සැලැස්ම සඳහා රාමුව පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| i. | පර්යේෂණ ගැටළුව | ii. | අරමුණු |
| iii. | නියැදිය | iv. | දත්ත රැස් කිරීම |
| v. | දත්ත විශ්ලේෂණය | vi. | වාර්තාකරණය |

(ලකුණු 12 යි)

05. I. පර්යේෂකයකුට සාහිත්‍ය විමර්ශනයක් ක්‍රියාත්මක කිරීමේ සුවිශේෂ ප්‍රයෝජන තුනක් නිදසුන් සමග සාකච්ඡා කරන්න. (ලකුණු 10)

II. පර්යේෂණ ක්‍රියාවලියක කුමන කොටසකදී හෝ ආචාරධර්ම පිළිබඳ ගැටළු මතුවිය හැකි ය. පහත දැක්වෙන අංග ඇසුරෙන් මතුවිය හැකි ආචාර ධර්ම පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම සඳහා ඔබට ගතහැකි ක්‍රියාමාර්ග නිදසුන් සමග සාකච්ඡා කරන්න.

1. දත්ත රැස් කිරීමේ ක්‍රම හා
2. ඔබගේ පර්යේෂණයට සහභාගි වන්නන්ගේ ස්වරූපය

(ලකුණු 10)

06. සම්පරීක්ෂණාත්මක පර්යේෂණ පිරිසැලසුම හා මානව විධි විවරණ පර්යේෂණ පිරිසැලැස්ම පහත දැක්වෙන මාතෘකා යටතේ සංසන්දනය කරන්න. අවශ්‍ය තන්හිදී සුදුසු නිදසුන් දක්වන්න.

(අ) ප්‍රධාන ලක්ෂණ
(ආ) පර්යේෂණ ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණු
(ඇ) අනුගමනය කළයුතු සුවිශේෂ පර්යේෂණ ක්‍රියාදාම
(ඈ) දත්ත රැස් කිරීමේ ක්‍රම.

(ලකුණු 20)

07. පර්යේෂණයක් මෙහෙයවීමේදී මුහුණදෙන ගැටළු කිහිපයක් පහත දැක්වේ.

(අ) ක්ෂේත්‍ර අධ්‍යයනයකින් රැස්කරන ලද විශාල දත්ත ප්‍රමාණයක්

(ආ) සම්පරීක්ෂණාත්මක පර්යේෂණයක පාලනය කළයුතු විචල්‍යයන්

(ඇ) පර්යේෂණයක් සඳහා සමස්ත නියැදි රාමුව නොමැතිවීම.

(ඈ) දත්ත එක් රැස් කිරීමේදී පර්යේෂකයාගේ පුද්ගලබද්ධතාව.

i. ඉහත දැක්වූ ගැටළු අතුරින් ගැටළු දෙකක් තෝරාගෙන එම ගැටළුවලට මූලික වන හේතු (දෙක බැගින්) සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

ii. එම ගැටළු දෙක විසඳීම සඳහා ඔබ ගන්නා ක්‍රියාමාර්ග (තුන බැගින්) දීර්ඝ ලෙස පැහැදිලි කරන්න.

(ලකුණු 08)

\- හිමිකම් ඇවිරිණි. -